අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2016

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II

පැය තුනයි

සැලකිය යුතුයි :

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** හිමි වේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන් මුද්‍රිත** කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන පිළිතුර තෝරන්න.

1. **කටුවට වහල්ලට නැති** මිනිසකු ලෙස ගම්වාසීන් මගේ මාමා හැඳින්වූවත් ඔහුගෙන් ගමට සිදුවූයේ නිහඬ සේවයකි.
   (1) කිසිවකුට ලෙන්ගතු කමක් නැති (2) කිසිදෙයක් ගැන තැකීමක් නැති
   (3) කෘශ වී ගිය සිරුරක් ඇති (4) ඉබාගාතේ ඇවිදින

2. **යළිත් වරක් ගල්පල්ලියට ගිය සිරිදාස අවට පරිසරය නැරඹුයේ සුපුරුදු නිවහනකට පැමිණියකුගේ විලාසයෙනි.**
   (1) වරදකරුවන් රඳවා සිටින ස්ථානය (2) ගලින් කළ දේවස්ථානය
   (3) කඳු ගැටයක පිහිටි පාසල (4) යාමට දුෂ්කර ගල්කුළ

3. සිමියොන් අයියා ඇරඹූ සියලු ව්‍යාපාර ව්‍යර්ථ වී ගියේ කුඩා කාලයේ සිටම ඔහු තුළ තිබූ **ඉදිකටු තුඩේ තපස් රැකීම** අත් හැරීමට නොහැකි වූ නිසාය.
   (1) අපහසුවෙන් හොඳ දෙයක් කිරීම (2) අකමැත්තෙන් යමක යෙදීම
   (3) දුෂ්කර කාර්යයක නියැලීම (4) කිසිසේත් කළ නො හැකි දෙයක යෙදීම

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

4. සමාජයක පවත්නා චාරිත්‍ර වාරිත්‍ර, නීතිරීති හා යහගුණදම් ..... බව සමාජ විද්‍යාඥයන්ගේ අදහසයි.
   (1) අනුල්ලංඝනීය (2) අනුස්මරණීය (3) අනුත්තරණීය (4) අනුද්ධමනීය

5. විදේශ රටවල වෙසෙන විවිධ ජාතීන්ගේ සිරිත් විරිත්, භාෂා, සංස්කෘති හා ආගම් පිළිබඳ අවබෝධයක් ලැබීම සඳහා ..... ඉතා ප්‍රයෝජනවත් වේ.
   (1) දේශාක්‍රමණය (2) දේශගවේෂණය (3) දේශාපහරණය (4) දේශාටනය

6. කවියක් නිර්මාණය කිරීමෙන් කවියකු අපේක්ෂා කරන්නේ කිසියම් අපූරු අත්දැකීමක් සූචනය කොට ..... තුළ චමත්කාරයක් දැනවීමයි.
   (1) ශ්‍රාවකයා (2) ප්‍රතිග්‍රාහකයා (3) ප්‍රේක්ෂකයා (4) පාඨකයා

7. අකාරාදී පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන වරණය තෝරන්න.
   (1) භෛරව, මහේශ්වර, පාණ්ඩිත්‍යය, විභේදන
   (2) පෞරුෂය, ඖරස, වශීකරණ, දූරදර්ශී
   (3) ත්‍රිශූලය, නිෂ්ප්‍රයෝජන, ව්‍යුත්පත්තිය, ශාස්ත්‍රාලය
   (4) දෘශ්‍යමාන, ෂණ්මුඛ, සංශෝධන, ද්විතීයක

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) ඓරාවණ, ව්‍යංග්‍යාර්ථ, නිශ්ශබ්ද, ඖෂධ
   (2) වීරෝදාර, සංක්ෂිප්ත, සංතුෂ්ටිය, නීත්‍යානුකූල
   (3) චෛත්‍යය, ඓතිහාසික, සම්ප්‍රධාය, ලේඛනය
   (4) වාර්තාව, දූරකථනය, සීග්‍රගාමී, ගැළපෙන

9. පහත දී ඇති පදවල පළමු අක්ෂරයෙහි **පිළිවෙළින් පාපිල්ල, ඇදපිල්ල, යංශය, රකාරාංශය,** යෙදී ඇති වරණය වන්නේ.
   (1) ගුවන, කැලය, විද්‍යමාන, ප්‍රවීණ
   (2) පැමිණිල්ල, කුහරය, අසාධ්‍ය, ක්‍රමය
   (3) ඔටුන්න, රැපියල, මාධ්‍යය, වෘකයා
   (4) රුවල, පැළය, ව්‍යවස්ථාව, ශ්‍රමය

10. **අන්‍යාර්ථ සමාසයට** නිදසුනක් නොවන්නේ.
   (1) සියපත (2) තිලෝනා (3) නිලඹර (4) මින්දද

11. **උක්ත නාම පද දෙකක්** හා **අනුක්ත නාම පද දෙකක්** පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
   (1) මිනිසෙක්, ගැහැනියක, ගොපල්ලෝ, මවක
   (2) බල්ලකු, ධීවරයින්, දරුවෙක්, නිළියක
   (3) තොප, ඔවුන්, මා, මම
   (4) පඬිවරුන්, කම්කරුවෝ, සේවිකාවෝ, වෘක්ෂයෝ

12. **තද්ධිතයක් නො වන** පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
   (1) ඉහට්, හැකියා, මුහුළස්, නළලත්
   (2) මුදුතා, මෑණි, දැහැමි, මොබ
   (3) සවනත්, සෞන්දර්ය, නාගරික, නැගණි
   (4) කෞශල්‍යය, අරිටු, ජ්‍යෙෂ්ඨ, ගරුත්ව

13. **තද කළු අකුරෙන්** මුද්‍රිත පදයේ විභක්තිය තෝරන්න.
   මිත්‍රද්‍රෝහී වූ පුරුෂ තෙම සිතනුයේ මම දවස් ගණනක් **නිරාහාරයෙන්** කිසි බලයක් නැතියෙමි.
   (1) කර්ම (2) කර්තෘ (3) කරණ (4) අවධි

- අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරින්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

14. අවට පරිසරයේ විචිත්‍රත්වය වර්ණනා කිරීමෙන් සේනාධිරගේ සිතෙහි ඇතිවන **ප්‍රහර්ෂය** කුළු ගැන්වෙයි.
   (1) උදාරත්වය
   (2) සංවේගය
   (3) අනුරාගය
   (4) සන්තෝෂය

15. පුද්ගලයකු තුළ ඉතා කලාතුරකින් පිහිටන භාෂාන්තර හා සමයාන්තර ඥානයක් ද **අත්‍යුත්කෘෂ්ට** ධාරණ ශක්තියක් ද එතුමා සතු විය.
   (1) ගරු කළ යුතු
   (2) ඉතා උසස්
   (3) අද්විතීය වන
   (4) අතීරමණීය

16. පරාධීනත්වයෙන් මුදවා ගැනීමේ **පරමාභිලාශයෙන්** ශ්‍රී ලාංකිකයන් පෙලඹවීම සඳහා එස් මහින්ද හිමියන් කළ නිර්මාණ බොහෝ ය.
   (1) විශාල කැමැත්තකින්
   (2) උසස් බලාපොරොත්තුවකින්
   (3) ජයග්‍රාහී හැඟීමකින්
   (4) මහත් සතුටකින්

17. මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.
   (1) නිපාත - වැලි, ඉක්බිති, තරම්, සෙද
   (2) උපසර්ග - දුදන, සුවිසල්, උදුළ, සබඳ
   (3) කෘදන්ත - කැපිලි, කැවිලි, සැකිලි, රැකිලි
   (4) මිශ්‍ර ක්‍රියාව - අඬමින්, නටමින්, කරකර, දුවමින්

18. දී ඇති වචන අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් ළං වන කාර්යයන් සමග බැඳී **නො පවත්නා** පද පේළිය වන්නේ.
   (1) බටනලාව, සර්පිනාව, වීණාව, ගැටබෙරය
   (2) ශ්‍රාවකයා, ප්‍රේක්ෂකයා, නාවිකයා, විචාරකයා
   (3) නීල, පීත, ඕදාත, ප්‍රභාස්වර
   (4) මුදුනා, දැතුරයා, මට්ටයා, කලාතයා

19. එක් එක් පේළියේ **සමානාර්ථ** යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
   (1) රොස් කොට - කෝප කර, ආප්ත - දැනුමැති, උක්තීන් - කියමන්, මාගමක් - ස්ත්‍රියක්.
   (2) පිළිබහා - වළක්වා, තෙදින් - තේජසින්, උවම් - උපමා, සබවස - තැනට ඔබින වචන.
   (3) කුලුණින් - කරුණාවෙන්, දිළිඳු - නිහීන, අමා - අමෘතය, ගම්හීරත්වය - ගැඹුරු බව.
   (4) බෝධිඝර - බෝධි ගෘහ, නිවහන - මාලිගය, පුෂ්පෝපහාර - මලින් පිදීම, බුජබල - ශරීර ශක්තිය.

[3 වන පිටුව බලන්න

20. මුලින්දී ඇති පදයට **සමානාර්ථයක් නො දෙන** පදය ඇතුළත් වරණය තෝරන්න.
(1) සිඳු - මුහුද, රුවනාර, උදධි, අර්ණව
(2) ඇතා - නා, වරණ, ගජ, හස්ති
(3) ගගන - ගුවන, වළාමග, ගහමග, වළාගැබ
(4) කත - ලිය, අඟන, අඹ, ලලනා

21. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) හායනය - වර්ධනය
(2) අර්ථශූන්‍ය - අර්ථපූර්ණ
(3) බණ්ඩනය - මණ්ඩනය
(4) ආහ්ලාදය - ආනන්දය

22. **අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය තෝරන්න.
(1) කියත උන් මෙතෙපල - ආයේය ඇදුරු ගුත්තිල
(2) හළොත් යෙහෙකි පව්කම් නොතබා ම සිත
(3) දකුතු රඟන සුරඟන රඟලාගේ
(4) දියුණු දියුණු ව නද - නික්ම පැතිරෙත දසත විනිවිද

23. **නිවැරදි** අදහස සහිත වරණය තෝරන්න.
(1) සෑම කර්මකාරක වාක්‍යයකම කර්මය උක්ත නො වේ.
(2) කර්මකාරක වාක්‍යවල ක්‍රියාපදයට ලබ ධාතු රූපය එකතු කිරීම අනිවාර්ය ලක්ෂණයකි.
(3) කර්මකාරකයට හැරවීමට හැකිවන්නේ සකර්මක ක්‍රියාධාතු පමණි.
(4) කාරක හය අතරට කර්මකාරකය ඇතුළත් නො වේ.

24. සෑම පදයකම **ඌෂ්මාක්ෂරයක්** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) විමර්ශනය - පරීක්ෂණය - ශීර්ෂය - නිර්මාණය.
(2) ශබ්දය - ආහ්ලාදය - අනුස්මරණ - ජිරාෆ්.
(3) ලේඛනය - විශේෂය - සහෝදර - ෆාතිමා
(4) සමුද්‍රය - චන්ද්‍රයා - අන්ධකාරය - සයුර

25. අක්ෂර මනාව ගැළපීමෙන් **ග්‍රන්ථ නාමයක්** කියවෙන වරණය තෝරන්න.
(1) පල්රතුපම
(2) යලිම්පෙරද
(3) නක්තරිතුව
(4) වංසංයපථූ

- අංක **26, 27** යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

26. බල්ලගේ වැඩේ බූරුවා බාරගත්තා වගේ
(1) කිසිදු කාර්යයක් හරි හැටි සිදු නො වීම
(2) අපේක්ෂිත කාර්ය වඩාත් අවුල් වීම
(3) තමාට පැවරූ කාර්ය වෙන අයකුට පැවරීම
(4) තමාට අයිති නැති කාර්යයක යෙදීම

27. කණාමැදිරි එළියෙන් නිදන් සොයනවා වගේ
(1) ප්‍රයෝජනයක් නැති වැඩක් සඳහා වෙහෙසීම
(2) කිසි ම ඉලක්කයක් නැති වැඩ කිරීම
(3) අවදානම් සහිත වැඩක යෙදීම
(4) ක්‍රියාවෙන් තමන්ගේ දුබලතා හෙළි වීම

28. පහත **(අ)** කොටසේ දැක්වෙන සන්ධි පද සමග **(ආ)** කොටසට අයත් **සන්ධි නාමය** අනුපිළිවෙළින් ගැළපෙන වරණය වන්නේ,

(අ)	(ආ)
A වියවුල්	E ස්වර සන්ධිය
B වල්ලම්බලම	F පර රූප සන්ධිය
C වක්කඩ	G ආගම සන්ධිය
D මලසුන	H ද්විත්ව රූප සන්ධිය

(1) E F G H
(2) G E F H
(3) F E H G
(4) G H F E

- අංක **29** සිට **30** යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව **නිවැරදි** වාක්‍ය තෝරන්න.

29. (1) ගුරුවරුන් විසිපස් දෙනෙක් චාරිකාවට සහභාගි වූහ.
(2) ගුරුවරු විසිපස් දෙනෙක් චාරිකාවට සහභාගි වූහ.
(3) ගුරුවරුන් විසිපස් දෙනෙකු චාරිකාවට සහභාගි වූහ.
(4) ගුරුවරු විසිපස් දෙනෙකු චාරිකාවට සහභාගි වූහ.

30. (1) අප හැම ලක්වැසියෝ වෙමු.
(2) බල්ලන් සපා කති'යි මා බිය වීමි.
(3) එක් අයෙක් චාරිකාවට සහභාගි වෙයි.
(4) මෑණියෝ දරුවෝ යහමග යවති.

31. (1) **රන්මාලය** කඩාගෙන සොරා වේගයෙන් පැන ගියේ ය.
(2) දැරිය **සුමිහිරි** ගීයක් ගායනා කළා ය.
(3) **දසපෙරුම් පිරූ** බෝසතාණෝ බුද්ධත්වයට පත් වූහ.
(4) **දිනකර** නැග එද්දී පියුම් විකසිත වන්නට විය.

උක්ත අංකිත පද පිළිවෙළින් ගැළපූ විට **නිවැරදි සමාස** වරණය වනුයේ.

(1) විභක්ති, අව්‍යය, විශේෂණ, අන්‍යාර්ථ
(2) විභක්ති, විශේෂණ, අන්‍යාර්ථ, අව්‍යය
(3) විශේෂණ, අව්‍යය, විභක්ති, අන්‍යාර්ථ
(4) අන්‍යාර්ථ, අව්‍යය, විභක්ති, විශේෂණ

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් **නිවැරදි** වරණය වන්නේ,
'විජය කුමාරයා මදුරා දේශයෙන් භාර්යාවක් ගෙනාවා'
(1) විජය කුමාරයා මදුරා දේශයෙන් භාර්යාවක් ගෙන ආවේය.
(2) විජය කුමාරයා මදුරා දේශයෙන් භාර්යාවක ගෙන ආවේය.
(3) විජය කුමාරයන් මදුරා දේශයෙන් භාර්යාවක් ගෙන ආවේය.
(4) විජය කුමාරයාණෝ මදුරා දේශයෙන් භාර්යාවක ගෙන ආවේය.

33. වැදිජන වහරෙහි **"ගයි ගැට"** යනුවෙන් අදහස් කරන්නේ
(1) පොල්
(2) පුවක්
(3) දෙල්
(4) කොස්

34. **රූපක අලංකාරය** සහිත වරණය තෝරන්න.
(1) මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී
(2) නීල ගොයම කිරි වැදිලා
(3) උඹේ සිනා කිරි උතුරා
(4) කන්නට පැන්නා මෙන් වැලහින්නී

35. A සුරාවට හා සූදුවට ඇබ්බැහි වූ ඔහුගේ සියලු ධනය නැති වී ගියේ ය. අවසානයේ ඔහුට සිදු වූයේ මහමග සිඟා කෑමටයි.
B මගේ තාත්තා රාත්‍රි ආහාරයට ගන්නේ ඉඳි ආප්පයි. ඇතැම් දිනක ඔහුගේ රාත්‍රි භෝජනය වන්නේ ආප්පයි.
C අනූපමා දක්ෂ ගායිකාවකි. වාදනය පිළිබඳ අල්පමාත්‍ර වූ දැනුමක් ඇයට නැත.
D කාන්තාව හැඳින්වීමට වනිතා යන්න යෙදේ. මහිලා යනු ද ඇයට භාවිත වේ.

ඉහත වාක්‍ය තනි වාක්‍ය වශයෙන් ගැළපීමේ දී නිපාත පද භාවිතයේ වඩාත් යෝග්‍ය අනුපිළිවෙළ වන්නේ,
E - හෝ F - හෙවත් G - නිසා H - වුවත්

(1) E, G, F, H (2) H, F, E, G (3) G, H, E, F (4) G, E, H, F

36. දී ඇති වරණ අතුරෙන් පහත සඳහන් කවියේ දෙවන පදය තෝරන්න.

ලීල් නැතිව නිසරුව තෙපලන්නේ
.....
වාල් තමාවත් ඇද්ද ඉතින්නේ
වාල් විඳින දුක මෙනුඹ විඳින්නේ

(1) පෙර කල් ජාතියෙ පැතුවා වැන්නේ (2) මහල්ල නුඹගේ හිමි ද අසන්නේ
(3) හැම කල් මළ දා දෝ සැප වන්නේ (4) නර මුල් ඇඟ ඇට කිඹුලකු වැන්නේ

37. එමින් කිරුළු රදහට පොරණ නිලතු රු
කෙළෙන් පසඟ තුරු නද ලැබ ම තනතු රු

මෙම ගීත බණ්ඩය ඇතුළත් නාට්‍යය වන්නේ,
(1) හුණුවටයේ කතාව (2) සුබ සහ යස (3) සිංහබාහු (4) තලමල පිපුණා

38. ධීවර කණ්ඩායමේ නායකයා ධීවර භාෂාවේ දී හැඳින්වෙන්නේ,
(1) හැන්නැදිරාල (2) මරක්කලාහේ (3) ජාලියෝ (4) අම්බාවෝ

39. පහත සඳහන් කවියේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වරණය තෝරන්න.

සුනෙර මතින් අලළන සඳ කිරි සයුර
ඉතිර වෙරළ දිව යන මෙන් රළ පතර
පැතිර උදය ගිරි සිරසින් දිලි නොහැර
මිතුර බලා ලව එන සඳ රස් වතුර

(1) මිත්‍රය මහාමේරු පර්වතය මන්ථය ලෙස ගෙන කිරි සයුර කලඹන කල්හි පැන දුවන රළ පන්තිය මෙන් දිලිසෙමින් උදය පර්වතය මුදුනින් එන සඳරැස් බලන්න.
(2) මිතුර බලන්න උදය පර්වතය මුදුනින් දිලිසෙමින් එන සඳ රැස් මහමෙර මන්ථයක් සේ ගෙන කිරි මුහුදු කලඹද්දී මතු වී පැතිර යන රළ පන්තිය වැනිය.
(3) මහාමේරු පර්වතය මන්ථය ලෙස ගෙන සයුර කලඹද්දී පැතිර යන රළ පන්තිය මෙන් දිලිසෙමින් උදය පර්වතය මුදුනින් එන සඳරැස් බලන්න, මිතුර.
(4) මිත්‍රය, මහාමේරු පර්වතය මන්ථය ලෙස ගෙන කිරි මුහුදු කලඹද්දී වෙරළ ඉතිරී පැතිර දිවෙන රළ සමූහය මෙන් නො නැවතී දිලිසෙමින් උදය පර්වතය මුදුනින් එන සඳරැස් බලන්න.

40. දී ඇති පාඨයේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වරණය තෝරන්න.

ජීවමාන භාෂාව කල්යාමේ දී නොයෙක් අදහස්, වචන කෝෂය හා අරමුණුවලින් වැඩි දියුණු වන නිසා අවුරුදු සිය ගණනකට පෙර සකස් කළ ව්‍යාකරණයක් මත ඉදිරියට ගමන් කරවීම කිසිසේත් නො කළ යුත්තකි.

(1) අවුරුදු ගණනකට පෙර සකස් කළ ව්‍යාකරණයක් මත ජීවමාන භාෂාවක් හැඩ ගැස්වීම අයෝග්‍ය වන්නේ එම භාෂාව නොයෙක් අදහස්, වචන කෝෂය හා අරමුණුවලින් වැඩි දියුණු වන නිසාය.
(2) අවුරුදු සිය ගණනකට පෙර සකස් කළ ව්‍යාකරණයක් මත ජීවමාන භාෂාවක් ඉදිරියට ගමන් කරවීම කෙසේවත් නො කළ යුතු වන්නේ යථෝක්ත භාෂාව අදහස්, වචන කෝෂය හා අරමුණුවලින් වර්ධනය වන හෙයිනි.
(3) අදහස්, වචන කෝෂය හා අරමුණු අතින් වර්ධනය වන නිසා පැරණි ව්‍යාකරණයක් මත ජීවමාන භාෂාවක් ගමන් කරවීම කිසිසේත් නො කළ යුතු ය.
(4) අවුරුදු සිය ගණනකට පෙර ලියූ ව්‍යාකරණයක් මත ජීවමාන භාෂාවක් ගමන් කරවීම අයෝග්‍ය වන්නේ යථෝක්ත භාෂාව අදහස්, වචන කෝෂය හා අරමුණු අතින් ක්‍රමයෙන් වර්ධනය වන නිසාය.

* *

සිංහල භාෂාව හා සාහිත්‍යය II

* ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

- අංක (**i**) සිට (**x**) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අදින්න**.

1. (i) (අ) ත, ප, ච, ද, න යන අක්ෂර අතර පවත්නා **ඝෝෂාක්ෂර** ලියා දක්වන්න.
(ආ) **සත්+ආශ්‍රය** එකතු වී **සදාශ්‍රය** සෑදෙන්නාක් මෙන් **තත්+අනුබද්ධ** එකතු වීමෙන් සෑදෙන පදය කුමක් ද?

(ii) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් **උපසර්ග දෙකක්** උපුටා දක්වන්න.
නාය යාමෙන් අවාසනාවන්ත ඉරණමකට ගොදුරු වූ ජනතාවට සහන සැලසීම සඳහා අතිමහත් පිරිසක් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූහ.

(iii) පහත සඳහන් **(අ)** සහ **(ආ)** යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන **තනිපදය** බැගින් ලියා දක්වන්න.
(අ) දිවි ඇති තාක්
(ආ) බැගෑපත් ව කරන ඉල්ලීම

(iv) පහත සඳහන් පද්‍ය ඛණ්ඩවල **තදකළු** අකුරෙන් මුද්‍රිත පද අයත් **ක්‍රියාවර්ග** නම් කරන්න.
(අ) අප නැති ව පියා ඔබ - ළය **පැළී** මැරී යයි
(ආ) උන් එදා දුන් රඟ **දුටොත්**- තව සක් සැපත් කවරෙක් පතා

(v) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **දෙක** පමණක් **නිදොස්** කර ලියන්න.
භාණ්ඩ මිල නිරන්තරයෙන් ම උච්ඡාවචනය වීම රටක ආර්ථික අභිවෘර්ධියට හිතකර ලක්ෂණයක් නො වේ.

(vi) පහත දැක්වෙන **(අ)** සහ **(ආ)** යෙදුම්වල පළමුවන වචනය සමග දෙවන වචනයේ නො ගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ **පළමුවන වචනය** හෝ **දෙවන වචනය** හෝ සකස් කර ලියන්න.
(අ) අලුසල් මංගල්‍යය
(ආ) විදේශ පුවත්

(vii) පහත සඳහන් වාක්‍ය සදොස් නම් ඒවා **නිදොස්** කර ලියන්න.
(අ) සියලු ම ක්‍රීඩකයෝ තරග ආරම්භක ස්ථානයට වාර්තා කර ඇත.
(ආ) සිරිමාන්න මහතා දක්ෂ වෛද්‍යවරයෙකු මෙන් ම වියත් ලේඛකයෙකු ද වෙයි.

(viii) පහත සඳහන් පද **සන්ධි කොට** ලියා **සන්ධි වර්ගය** නම් කරන්න.
(අ) පූජා + උත්සවය
(ආ) එකින් + එක

(ix) පහත දැක්වෙන පද්‍ය පාඨවල **තදකළු** අකුරෙන් මුද්‍රිත පදවල අර්ථය වෙන වෙන ම ලියන්න.
නුබ සා මඬුලු සඳ වෙල ළපලු පැහැපත
උදය'ග රැක සඳ මල් කැනක සිරිගත

(x) පහත දැක්වෙන ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා **පොදු වහරේ** යෙදෙන වචන ලියන්න.
(අ) කළුකපාඑළිය
(ආ) මානාවාරිය

(ලකුණු 02 x 10 = 20)

2. පහත දැක්වෙන **අ, ආ, ඉ, ඊ** යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන, **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) නිර්මාණාත්මක ගද්‍ය පද්‍ය ග්‍රන්ථ හා වෙනත් විවිධ විෂය ගැන ලියැවුණු කෘති දේශීය සාහිත්‍යයට, පරිවර්තනය කෙරේ. මේ අදහසෙහි සත්‍යතාව සිංහල සාහිත්‍යය ගැන සැලකීමේ දී වඩාත් තහවුරු වේ. පරිවර්තන සාහිත්‍ය ග්‍රන්ථ බිහි වීම සාහිත්‍ය පෝෂණයට ද බෙහෙවින් උපකාරී වේ. පෙරපර දෙදිග ලේඛකයන් හා ඔවුන්ගේ කෘති ගැන තොරතුරු අපට දැනගන්නට ලැබෙන්නේ මේ පරිවර්තන නිසාය. මේ අනුව පරිවර්තන සාහිත්‍යය නිසා සිංහල පාඨකයාට සැලසී ඇති සේවය ඉතා වැදගත් වේ.

(ආ) රටක ජීවත්වන කිසියම් ජන කොටසක් අනෙක් ජන කොටස්වලින් වෙනස් වනුයේ ඒ ජන කොටස් සතු අනන්‍යතා ලක්ෂණ නිසාය. මේ අනන්‍යතා ලක්ෂණ අතරට භාෂාව හා සාහිත්‍යය, ආගම, සංස්කෘතිය, සාරධර්ම ආදිය ඇතුළත් වේ. ශ්‍රී ලාංකිකයන්ට ද විශේෂ වූ අනන්‍යතා ලක්ෂණ පවතී. මේ අනන්‍යතා ලක්ෂණ විමර්ශනය කිරීමෙ දී මෙරට වැසියන්ගේ උත්කෘෂ්ට ගුණාංග කැපී පෙනේ.

(ඉ) මෙරට දිළිඳු පුද්ගලයන් නගා සිටුවීම සඳහා බලයට පත්වන රජය මගින් කෙරෙන්නේ විවිධ ව්‍යාපෘති මගින් ඔවුනට සහනාධාර ලබා දීමයි. විවිධ ආපදා හා විපත්වල දී අනුගමනය කෙරෙන්නේ ද මේ ක්‍රියා මාර්ගයයි. ක්ෂණික විසඳුම් වශයෙන් මෙබඳු සත්කාර්යයන්හි අයෝග්‍යතාවක් නො පෙනේ. එහෙත් දීර්ඝකාලීනව සහනාධාර මත මහජනතාවට යැපෙන්නට සැලැස්වීම කෙතරම් දුරට යෝග්‍ය වූවක් ද යන්න විමසීමට ලක් විය යුතු ය.

(ඊ) පවුලේ සියලු දෙනා කැටුව යාපනය නැරඹීමට යාමේ ආශාවක් අපේ තාත්තාගේ සිතෙහි කාලයක සිට පැවතුණි. ඔහු එහි යාමට තීරණය කළේ ගුවන් මගිනි. එසේ කළේ මෙරට පරිසරය ගුවනේ සිට නැරඹීමටයි. නියමිත දිනයේ අප හැම දෙනා කැටුව තාත්තා රත්මලාන ගුවන් තොටුපළට ළඟා විය. අපි යාපනයට යාමට නියමිත ගුවන් යානයට නැංගෙමු. මොහොතකින් ගුවන් යානය අහසට නැංවිණි. කොළඹ සිට යාපනය තෙක් ගිය ගුවන් ගමනේ දී අහසේ සිට මා දුටු මනස්කාන්ත දර්ශනයෙන් මගේ සිත්සතන් වශීකෘත විය. එය වර්ණනා විෂයාතික්‍රාන්ත දර්ශනයකි.

(ලකුණු 25 යි)

3. පහත දැක්වෙන පාඨය වචන **50 - 60** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ **වචන සංඛ්‍යාව** ද සාරාංශය අග ලියන්න.

ආර්ථික යටිතල පහසුකම්වලට ප්‍රවාහන, බලශක්තිය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ වාරි මාර්ග ඇතුළත් වේ. ආර්ථිකමය යටිතල පහසුකම්වල ආයෝජනය කිරීම නිෂ්පාදන පදනම පුළුල් කිරීමට, තරගකාරිත්වය වැඩි දියුණු කිරීමට හා සේවා නියුක්ති අවස්ථාවන් ජනනය කිරීමට උපකාරී වේ. තව ද ආර්ථික යටිතල පහසුකම් සම්පත් උපයෝජනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට මෙන් ම, ඵලදායිතාව හා ආර්ථික වර්ධනය ඉහළ නැංවීමටත් උපකාරී වන අතර, පළාත් අතර වෙළෙඳාම සඳහා ඇති විභවතාව වැඩි දියුණු කරයි. එම නිසා ආර්ථික වර්ධනයට වැඩි දායකත්වයක් ඇති සහ අඩු දායකත්වයක් ඇති ප්‍රදේශ අතර ප්‍රවාහනය, මාර්ග සන්නිවේදන සේවා මගින් මනා භෞතිකමය සම්බන්ධතාවක් ඇති කිරීම තුළින් ප්‍රවාහන වියදම අඩු කළ හැකි අතර, ආර්ථික වර්ධනයට අඩු දායකත්වයක් ඇති ප්‍රදේශවල කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වෙළෙඳපොළක් ඇති කිරීමට ද, එමගින් රැකියා අවස්ථා ජනනය කිරීමට ද හැකි වේ.

මේ අතර රජයේ ජාතික මට්ටමේ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ, භාණ්ඩ සහ මගී ප්‍රවාහනය වැඩි දියුණු කිරීම සඳහා අන්තර් පළාත් මහා මාර්ග සහ දුම්රිය මාර්ග ඉදි කිරීමට කටයුතු කිරීම, නුදුරු අනාගතයේ දී ආර්ථික ප්‍රතිලාභ ජනිත කිරීමට හේතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථික යටිතල පහසුකම් දියුණු වීමත් සමග ආර්ථික වර්ධනයට අඩු දායකත්වයක් ඇති ප්‍රදේශවල ආර්ථික ව්‍යුහය වෙනස් වීමට අවශ්‍ය වෙළෙඳපොළ බලවේග සැකසෙනු ඇත.

(ලකුණු 10 යි)

4. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති **ප්‍රශ්නවලට උත්තර** සපයන්න.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ධාරිතා සීමාකම් හමුවේ වුවද, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා පෞද්ගලික අංශයට සහභාගි වීමට ඉඩ ලබා දුනහොත්, එම ප්‍රතිපත්තිය උසස් අධ්‍යාපනය සඳහා අඩු ආදායම්ලාභී සිසුන්ට ඇති අවස්ථා අහිමි වීමට හේතු වනු ඇතැයි යන වැරදි මතය හේතුවෙන් ඒ සඳහා පෞද්ගලික අංශයට අවස්ථාව ලබා නොදුනි. කෙසේ නමුත් අවාසනාවකට මෙන් එම ප්‍රතිපත්තියෙහි ප්‍රතිඵලය වූයේ පොදු විශ්ව විද්‍යාල පද්ධතියේ පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා මූල්‍යමය හැකියාවක් ඇති අය ඉහළ පිරිවැයක් දරමින් විදේශීය විශ්ව විද්‍යාලවල ඒ සඳහා අවස්ථාව ලබා ගැනීමත්, අඩු ආදායම්ලාභී කොටස්වලට උසස් අධ්‍යාපනය සඳහා ඇති අවස්ථාව පොදු විශ්ව විද්‍යාල පද්ධතියේ පවතින සීමාකම්වලට යටත් වීමත් ය. එසේ ම, මධ්‍යම ආදායම් ලබන පන්තියේ උසස් අධ්‍යාපනය සඳහා වියදම් දැරීමේ හැකියාව ඉහළ යාමත් සමග, එම දෙමාපියන් තම දරුවන්ට දේශීය ව උසස් අධ්‍යාපනය ලැබීමට අවස්ථා හිමි නොවීමත් හේතු කොටගෙන ඒ සඳහා වෙනත් රටවලින් එම අවස්ථා සොයා ගැනීමට පෙලඹී ඇත.

(i) උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට පිවිසීමට පෞද්ගලික අංශයට අවස්ථාව ලබා නොදුන්නේ ඇයි ?
(ii) උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට පිවිසීම සඳහා පෞද්ගලික අංශයට සහභාගි වීමට ඉඩ ලබා නො දීම නිසා ඇති වූ ප්‍රතිඵල මොනවා ද?
(iii) මේ පාඨයේ ඇතුළත් ආදායම්ලාභී කොටස් සියල්ල නම් කරන්න.
(iv) මෙහි දැක්වෙන වැරදි මතය කුමක් ද?
(v) වෙනත් රටවලින් උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා ඇතැම් ආදායම් මට්ටම්වලට අයත් දෙමවුපියන්, තම දරුවන් යොමු කිරීමේ හේතු දක්වන්න.

(ලකුණු 10 යි)

5. අධ්‍යාපන කාර්යයෙහි නියැලි තරුණ තරුණියන් උදෙසා පරිගණක ප්‍රදර්ශනයක් හා අලෙවි සලක් පැවැත්වීමට ගම්පහ 'දිය නැණ' ආයතනය තීරණය කර ඇත. මෙහි දී පහසු ගෙවීමේ ක්‍රමයට විවිධ මාදිලියේ පරිගණක වර්ග හා පරිගණක උපාංග ලබා ගැනීමට ද පහසුකම් සලසා ඇත. එකවර මුදල් ගෙවන්නන් වෙනුවෙන් ආකර්ෂණීය වට්ටම් ලබා දීමට ද අපේක්ෂිතය. දින 03ක් පුරා පැවැත්වෙන මෙම ප්‍රදර්ශනය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කරන්න.
(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය)

නැතහොත්

මහරගම - තරුපති විද්‍යාලයීය පරිසර සංගමය, මෙවර ලෝක පරිසර දිනය වෙනුවෙන් විද්‍යාල භූමියෙහි ඖෂධ උයනක් සැකසීමේ ව්‍යාපෘතියක් දියත් කිරීමට අපේක්ෂිතය. මෙහි දී විවිධ වර්ගයේ ඖෂධ පැළ 100ක් පමණ සිටුවීමට අදහස් කරගෙන ඇත.
මේ සඳහා අවශ්‍ය උපදෙස් හා ඖෂධ පැළ ඉල්ලා පරිසර සංගමයේ ලේකම් වශයෙන් පළාතේ ආයුර්වේද කොමසාරිස්තුමා වෙත යැවීමට ලිපියක් ලියන්න.
ලිපිය ලියන ඔබ පරිසර සංගමයේ ලේකම් උදිත හේරත් යයි සිතන්න.
(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

(ලකුණු 15 යි)

* * *

අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2016

සිංහල භාෂාව හා සාහිත්‍යය III

පැය දෙකයි

වැදගත් : උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.

* **1, 2, 3, 4** ප්‍රශ්නවලටත් **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80** කි.

---

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි අංකය ලියා ඉරක් අඳින්න.

(i) "ම පුතුන් වැන්නවුන්ට භයෙක් කොයින් ද?"
(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දේ ද?
(ආ) මෙය උපුටාගත් කෘතියට මූලාශ්‍රය වූ කෘතිය නම් කරන්න.

(ii) "එල්ල වෙන්ට කවි කර කීවෙමි බොහොම
කොල්ල කන්ට එති සිවුපාවෝ බොහොම"
(අ) මෙම පද්‍යයෙහි ඉතිරි කවි පේළි දෙක නිවැරදි ව සම්පූර්ණ කරන්න.
(ආ) මෙම පද්‍යය අයත් වන්නේ කුමන ජනකවි ගණයට ද?

(iii) "පුත, එයින් මට කියා ද ගන්නේ? ඇර ගන්ව"
(අ) මෙය කවුරුන් විසින් කරනු ලැබූ ප්‍රකාශයක් ද?
(ආ) ඇර ගන්වයි කීවේ කුමක් ද?

(iv) "දවස් ගානක් තිස්සේ මං මෙහාට ආවෙ මේක දැනගන්ඩ"
(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ තැනැත්තා කවරෙක් ද?
(ආ) මෙය ප්‍රකාශ කළ අය ආවේ කුමක් දැනගැනීමට ද?

(v) "මිහ'ඹ මුව මඬල මෙන් දිලෙන හැම විට
දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර සිට"
(අ) මෙම පද්‍යය ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතිය ලියූ රචකයාගේ තවත් කෘති දෙකක් නම් කරන්න.

(vi) "පාර අයිනෙ එහෙම එකක් තියන එක හරි"
(අ) මෙහි එහෙම එකක් යනුවෙන් සඳහන් වූයේ කුමක් ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කතාව උපුටා ගත් කෘතිය කුමක් ද?

(vii) "**බල** පිරි සෙන් සහ යාපා පටුන් ගෙන
බල සේනානායක සපු කුමරු එන"
(අ) ඉහත දැක්වෙන සිදුවීම කුමන රජු ගේ කාලයේ සිදු වූවක් ද?
(ආ) මෙහි දෙතැනක යෙදී ඇති "බල" යන පදයේ අර්ථ වෙන් වෙන් ව ලියන්න.

(viii) **(අ)** දියමන්ති මාලය නමින් පරිවර්තිත කෙටි කතාව ලියූ මුල් රචකයා කවරෙක් ද?
(ආ) ලොයිසල් මහත්මිය දියමන්ති මාලය ණයට ගත්තේ කාගෙන් ද?

(ix) "මේ සියල්ල හැර දා මම
ආවෙමි වලටා
වෙසෙන ලෙසා ඔබ පිය මා
සමිඳුන් සමගා"
(අ) මෙම ප්‍රකාශය කරන්නේ කවරෙක් ද?
(ආ) මෙහි සමිඳුන් යන්න යෙදී ඇත්තේ කවරෙකු උදෙසා ද?

(x) "ගුත්තිල මහ සිපී
සක්දෙව් බසින් සැතපී
මින් දිනමැ යි දැපී
බමර තත පළමුවෙන් සිඳපී"

(අ) මෙය සිදුවූයේ කුමන ස්ථානයකදී ද?

(ආ) බමර තත යනු කුමක් ද?

(ලකුණු 20 යි)

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) "නඟන ලද මිණි දඬු වැටෙහි ලක්ෂ ගණන් පහන් ආලෝකයෙන් ද එක් සියයක් රජ දරුවන් හා **හස්ත්‍යශ්වාදි** සේනාව හා පලන් ආභරණයෙහි ආලෝකයෙන් ද සියලු සත් යොදුන් මියුලු නුවර ඒ මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥා නමැති සූර්යයා පහළ ව සත්ත්වයන්ගේ සිත මෝහන්ධකාර **විගමනයෙන්** හෙළි වූ කලක් පරිද්දෙන් ආලෝක විය."

(අ) මෙම පාඨය කුමන අවස්ථාවක් හා සම්බන්ධවේ ද?

(ආ) අංකිත පදවල අර්ථ ලියන්න.

(ii) "මඟ නිලමින් සිටි නා දොඹ නී පියල
පිය සලමින් මලගෙහි කෙළැ **රොනින'වල**
තතුඩ ලමින් බිඳැ **විලිකුන්** මියුරු පල
ඉසිඹු ලමින් යෙහි සැළ දඹ පඳුරු වල"

(අ) මෙහි දූතයා කළ යුතු යැයි පැවසෙන කාර්යයන් දෙකක් ලියන්න.

(ආ) අංකිත පදවල අර්ථ ලියන්න.

(iii) "තො අඟුල්මල්හු කෙහෙ බහා සිවුරු හැඳැ පෙරෙවැ පැවිජි වැ පණිවා ඈ පව්කැමින් විරත වැ එක් වෙලෙ වළඳා බඹසරවස් රැකැ සිල්වත් වැ කලණදහම් පුරා වසන්නහු දිටිහි නම්, උහුට කුමක් කෙරෙහි ද?"

(අ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ආ) මෙහි අඟුල්මල්ගේ ජීවන චක්‍රය වෙනස් වූ ආකාරය අනාවරණය වන්නේ කෙසේ ද?

(iv) "තුමුල ගතින්දා
බාහු බෙලෙන්දා
වෙමි සේ තිදසින්දා
කුරිරු ගිජින්දා
කුඹු තල සින්දා
ලමි සේ කෙසරින්දා
මා පිය මිගිඳා කරනා විකුමන්
ඇයි මට බැරි වන්නේ "

(අ) මෙහි තමාට කළ නොහැකි දැයි විමසන්නේ මොනවා ද?

(ආ) මෙහි සඳහන් උපමා දෙකක් සරල බසින් ලියන්න.

(v) "මැගේ මේ අභිමානය මෑට වඩා සම්පත් ඇත්තන් ඇති හෙයින් සම්පතක් නිසාත් නො වෙයි. තමා ජාති සම්පන්න නොවන හෙයින් ජාතියක් නිසාත් නො වෙයි. රූපත් හෙයින් ඒ හා තමා දන්නා ශිල්ප පමණක් නිසා ය. මෑ දන්නා ශිල්පත් උගත් හෙයින් මුත් සයංසිද්ධ නො වන්නේ වේ ද? ඇගේ ඒ බෑවුම් පලවා මමත් ....."

(අ) මෙහි සඳහන් තැනැත්තිය අභිමානයක් ඇති කර ගත්තේ කුමන කරුණු නිසා ද?

(ආ) මෙහි "මමත්" යනුවෙන් සඳහන් තැනැත්තා ඉන් පසුව කළේ කුමක් ද?

(ලකුණු 4x5 = 20 යි)

3. ජාතක කතාකරුවා

(අ) බෝසත් චරිතය උසස් කොට දැක්වීමත්

(ආ) බමුණු සමාජය උපහාසයට ලක් කිරීමත්

අරමුණු කර ගෙන උම්මග්ග ජාතකය රචනා කර ඇත. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

නැතහොත්

අංගුලිමාල දමනය කතාවේ නිරූපිත අහිංසකගේ චරිතයෙන් හෙළිවන්නේ

(අ) සූවච/ කීකරු ගති ලක්ෂණත්

(ආ) බාහිර හේතු නිසා අපරාධකාරයෙකු වීමත්

යන ලක්ෂණ වේ. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 15 යි)

4. ගුත්තිල කාව්‍යය වනාහි

(අ) අර්ථ රසය

(ආ) ශබ්ද රසය

මැනවින් සංකලනය වූ රසවත් කාව්‍ය නිර්මාණයකි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

නැතහොත්

ශ්‍රී රාහුල හිමියන් සැළලිහිණි සංදේශය රචනයේ දී

(අ) වස්තු විසිතුරු කිරීම

(ආ) අවස්ථා නිරූපණය යන අංශ කෙරෙහි දැක්වූ කුසලතාව නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

5. "ජන කවියාගේ අරමුණ වූයේ යහපත් සමාජයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය උපදේශ ඉදිරිපත් කිරීමයි" නිර්දිෂ්ට ජන කවි ඇසුරෙන් උදාහරණ **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න.

6. "සිංහබාහු නාට්‍යයෙන් නිරූපණය වන්නේ ගතානුගතිකත්වය හා නූතනත්වය අතර පවතින ගැටුමයි." නියමිත කොටසින් උදාහරණ **තුනක්** ගෙනහැර දක්වමින් විමසන්න.

7. "අවස්ථා හා සිද්ධි නිරූපණයට යෝග්‍ය භාෂා ශෛලියක් යොදා ගැනීම බැද්දේගම නවකතාවේ සාර්ථකත්වයට හේතු විය." නියමිත කොටසින් උදාහරණ **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

* * *